"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம் ,32, ஸ்ரீமத் மார்க்கஸ் பெர்னாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary } දුරකථන / தொலைபேசி / Telephone - 2698409; ෆැක්ස් / பெக்ஸ் / Fax - 2694667; ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி / General Telephone } 2682868, 2682869, 2682870

මගේ අංකය. / எனது இல. / My No. } CSO/FIN/2/3/2(ii) | ඔබේ අංකය. / உமது இல. / Your No. } | දිනය. / திகதி. / Date. } 2017.02. 16

**බස්නාහිර පළාත්**

**වාපාර චක්‍රලේඛ අංක 02/2017**

බස්නාහිර පළාතේ,
සියළුම ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතන වල
සභාපතිවරුන් වෙත.

**පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතනවල කාර්ය මණ්ඩලට 2016 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීම.**

මහා භාණ්ඩාගාර ලේකම්ගේ 2016.12.16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 05/2016 හි දැක්වෙන උපදෙස් සැලකිල්ලට ගෙන පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතනවල කාර්ය මණ්ඩලයට 2016 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

01. ප්‍රසාද දීමනා ගෙවීම.

2016 වර්ෂය සඳහා පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතනවල කාර්ය මණ්ඩලට පහත පරිදි ප්‍රසාද දීමනා ගෙවීම් කල හැකිය.

| අනු අංකය | ආයතනයේ වර්ගය | යෝජිත ප්‍රසාද දීමනාව රු. |
|---|---|---|
| 01 | අදාල මුදල් වර්ෂය තුල ලාභ උපයාගෙන ඇති හා පැමිණීම, කාර්ය සාධනය හෝ වෙනත් පදනමක් මත දිරිකාරක ගෙවනු නොලබන හෝ නොගෙවූ පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතන . | 15,000.00 |
| 02 | අදාල මුදල් වර්ෂය තුල ලාභ උපයාගෙන ඇති හා පැමිණීම, කාර්ය සාධනය හෝ වෙනත් පදනමක් මත දිරිකාරක ගෙවනු ලබන හෝ ගෙවනු ලැබ ඇති පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතන . | 13,500.00 |
| 03 | අදාල මුදල් වර්ෂය තුල අලාභ තත්වයක් වාර්තා කර ඇති හා පසුගිය මුදල් වර්ෂයට සාපේක්ෂව එම අලාභදායී බව අඩුකරගෙන ඇති පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතන . | 5,000.00 |
| 04 | අදාල මුදල් වර්ෂය තුල අලාභ තත්වයක් වාර්තා කර ඇති හා එම අලාභදායී බව පූර්ව මුදල් වර්ෂයට සාපේක්ෂව අඩුකර ගැනිමට අපොහොසත් වූ පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතන, එවැනි ආයතනවල සේවය කරන සේවකයින් කෙරෙහි සානුකම්පිතව සලකා බලා . | 2,000.00 |


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුල්‍ය / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන / பணிப்பாளர் (உள்ளக கணக்காய்வு) / Director Internal Audit |
|---|---|---|---|---|---|---|
| | Tel: 2693964 Fax:2669479 dcsadmin@cs.wpc.gov.lk | Tel: 2690058 Fax:2693952 dcspi@cs.wpc.gov.lk | Tel: 2693978 Fax:2679958 csfinance@wpc.gov.lk | Tel: 2693970 Fax:2676280 dsplancs@wpc.gov.lk | Tel: 2693968 Fax:2689900 dsengcs@wpc.gov.lk | Tel: 2689011 Fax:2689011 |

02. ප්‍රධාන ලේකම්ගේ එකඟත්වය.

අදාල මුදල් වර්ෂය තුල අලාභදායී තත්වයක් වාර්තාකර ඇති පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතන කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනාව ගෙවීමට ප්‍රථමයෙන් ප්‍රධාන ලේකම්ගෙන් එකඟතාව ලබා ගත යුතුය. මේ සඳහා අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය සමඟ ඉදිරිපත් කල යුතුය.

03. අනුගමනය කල යුතු පිළිවෙල

3.1 ප්‍රසාද දීමනාවක් සේ සලකනු ලැබිය හැකි අර්ධ වාර්ෂික දීමනාවක් කිසියම් ආයතනයක් විසින් සිය කාර්ය මණ්ඩලයට ගෙවා ඇති විටක, එම ගෙවීම අතිරේක ප්‍රසාද දීමනාවක් ලෙස සැලකීමට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඇත්නම් මිස, එය වසර අවසානයේ ගෙවනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනාවේ අත්තිකාරමක් සේ සැලකිය යුතුය.

3.2 මෙම චක්‍රලේඛය මත පදනම්ව වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ පාලක සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

3.3 ඉහත ප්‍රසාද දීමනා ගෙවීම සඳහා, අදාල පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතනවල වාර්ෂික ගිණුම් නියමිත දිනට හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබ තිබිය යුතු අතර, රජය විසින් නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සම්බන්ධයෙන් උපදෙස් හා මාර්ගෝපදේශ නිසි පරිදි පිළිපැද තිබිය යුතුය.

04. විශේෂ කරුණු

4.1 ප්‍රසාද දීමනා ගෙවීම සඳහා මුදල් පළාත් භාණ්ඩාගාරය විසින් සපයනු නොලැබේ.

4.2 සාමූහික ගිවිසුම් හෝ ඒ හා සමාන අවබෝධතා ගිවිසුම් මගින් වැටුප් හා දීමනා ක්‍රියාත්මක කරන පළාත් සභා අධිකාරි/ව්‍යවස්ථාපිත ආයතනවලට මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාල නොවේ.

4.3 ඉකුත් වර්ෂවලදී සාමාන්‍ය පටිපාටියෙන් බැහැරව ප්‍රසාද දීමනා ගෙවීමට අනුමැතිය ලබා ගත් සහ මෙම වසරේදී ද එකී පරිපාටියම අනුගමනය කිරීමට අදහස් කරන ආයතන 2016 වර්ෂය වෙනුවෙන් එසේ ප්‍රසාද දීමනා ගෙවීම සඳහා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

4.4 මෙම චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව එක් එක් ආයතන විසින් ප්‍රසාද දීමනා ගෙවීමට අදාලව පසුගිය වසර තුල අනුගමනය කරන ලද පරිපාලන ක්‍රමවේදය පදනම් කරමින් මෙම වසරේද ප්‍රසාද දීමනා ගෙවිය හැකිය.

4.5 ප්‍රසාද දීමනා ගෙවනු ලබන,පළාත් සභා අධිකාරි/ ව්‍යවස්ථාපිත ආයතන විසින් සේවක අර්ථ සාධක අරමුදල්, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල්, පාරිතෝෂික හා උපයන විට බදු ගෙවීම් සියල්ල අදාල අණ පණත් අනුව ගෙවීමට සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය හා ප්‍රධාන විධායක නිලධාරීන් බැඳී ඇති බැවින් ප්‍රසාද දීමනා ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඉල්ලනු ලබන අවස්ථාවේ පවත්නා තත්වය පිළිබඳ වාර්තා කිරීමටත් වග බලා ගත යුතුය.

එම්.ඒ.බී.දයා සෙනරත්,
ප්‍රධාන ලේකම්,පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් හා පළාත්
භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත්:
i. ආණ්ඩුකාර ලේකම් (බ.ප.)
ii. විගණකාධිපති.
iii. සියළු නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (බ.ප.)
iv. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) (බ.ප.)
v. පරිඝනක දත්ත ක්‍රියාකරු